# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2019 ජනවාරි මස 08 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

**01.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.12.04 වන දින අසන ලද ප්‍රශ්නය,

[ප්‍ර/VI(1)/18/75]

---

(අ) ගම්පහ දිස්ත්‍රික්කයේ සී/ස බෙම්මුල්ල වීගොඩ සණස සමිතියේ සියලු දේපලවල වටිනාකම කොපමණ ද?

(ආ) ගම්පහ දිස්ත්‍රික්කයේ සී/ස බෙම්මුල්ල වීගොඩ සණස සමිතියේ තැන්පත් කරුවන්ගේ කල් පිරුණුකල ගෙවන පොලී මුදල් ආපසු ලබා නොදෙන බව ඔබතුමා දන්නෙහිද?

(ඇ) එකී සමිතියේ තැන්පත් කරන ලද මුදල් එහි සභාපතිගේ පෞද්ගලික සමාගමක් වන දීගායු නමින් පිහිටුවා තිබෙන සමාගම වෙත යොමු කරන බව ඔබතුමා දන්නෙහිද?

(ඈ) එකී සමිතියේ තැන්පත් කරුවන්හට ඔවුන්ගේ තැන්පතුවල අදාල පොලිය හා සියලු මුදල් තැන්පත්කරුවන් විසින් ඉල්ලන ඕනෑම විටකදී ලබා දීමට හැකිද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) සමිතියේ මුදල් සභාපතිවරයා විසින් ඔහුගේ පෞද්ගලික සමාගම හරහා ඉඩම් මිලදී ගැනීම් හා විකිණීම් කටයුතු හා වෙනත් කටයුතු සඳහා යොදවන බව ඔබතුමා පිළිගන්නෙහිද?

(ඊ) තම අභිමතය පරිදි කටයුතු කරමින් අදාල තැන්පත්කරුවන්ට ඔවුන්ට හිමි මුදල නොගෙවීමට කටයුතු කරන අදාල සභාපතිවරයාට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගයන් හා අදාල තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කර දීමට ගනු ලබන ක්‍රියාමාර්ගයත් ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(උ) නොඑසේ නම් ඒ මන්ද?

**02.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.12.04 වන දින අසන ලද ප්‍රශ්නය, [ප්‍ර/VI(1)/18/76]

(අ) ගම්පහ දිස්ත්‍රික්කයේ සි/ස බෙම්මුල්ල වීගොඩ සණස සමිතියේ වර්තමාන සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් මොනවාද? යන්නත්, ඔවුන් වෙනත් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ ප්‍රධාන නිලයක් දරන්නේද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එහි සභාපතිවරයා විසින් ඔහුගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නමින් ඇති දීගායු ලෑන්ඩ් හෝම්ස් නමින් ආයතනයක් පවත්වාගෙන යන බවත්, සණස සමිතියේ මුදල් එම සමාගම වෙත කිසිදු පොළියක් හෝ ඇපකරයක් නොමැතිව ලබා දී ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ඇ) එකී සණස සමිතියේ තැන්පතු නීති විරෝධී ලෙස සභාපතිවරයා විසින් භාවිතා කිරීම හේතුවෙන් අදාල සණස සමිතිය මූල්‍ය අර්බුදයකට පත්ව ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

(ඈ) මේ වන විට තැන්පත්කරුවන් විසින් තම මුදල් ඉල්ලීම් කල විට සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා නොදෙන බව ඔබතුමා දන්නෙහිද?

(ඉ) අදාල සණස සමිතියේ තැන්පත්කරුවන් හට කඩිනමින් ඔවුන්ගේ මුදල් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) අදාල සමිතිය සතු මුදල් වෙනත් කාර්යයන් වලට යෙදවූ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

(උ) නොඑසේ නම් ඒ මන්ද?

**03.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, [ප්‍ර/VI(1)/18/79]

අ. i. ජයවර්ධනපුර කලාපයට අයත් තලපත්පිටිය සිද්ධාර්ථ විද්‍යාලයේ විදුහල්පතිවරයා හා ආචාර්ය මණ්ඩලය අතර පවතින ආරවුලක් සම්බන්ධව දැනට විමර්ශනයක් ආරම්භ කර තිබේද?

ii. එම විමර්ශනවලට පාදක වූ පැමිණිලි ඉදිරිපත් වූ දිනයන් කවරේද?

iii. මෙහිදී එල්ලවන චෝදනා මොනවාද?

iv. එම විමර්ශන මේ වනවිට අවසන් කර තිබේද?

v. නැතිනම් එයට හේතුව කුමක්ද?

ආ. i. එම විමර්ශන වල ප්‍රතිඵල මත පාසලේ ගුරුවරයෙකු ස්ථානමාරු කර තිබේද?

ii. ඒ අනුව ඔහුට රල්ලවන චෝදනා සම්බන්ධව විධිමත් පරීක්ෂණ ආරම්භ කර තිබේද?

iii. එම ගුරුවරයාට මූලික විමර්ශන මත ස්ථානමාරු ලබාදීමට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් වෙනත් ස්ථානමාරුවීම් ලබාදී තිබේද?

iv. එය කුමන හේතු මත කුමන පාසල් වලටද?

ඇ. ඒ අනුව මෙම සියලු පැමිණිලි සම්බන්ධව විමර්ශන සිදුකර, එහි ප්‍රතිඵල අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නේද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. සභාවේ කටයුතු

<u>ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,</u>

යෝජනාව :

"2018.10.23 හා 2018.12.19 යන දින වල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ලද එකඟතාවයට අනුව, කාර්යය පටිපාටි රීති අංක 39(4) හා 53(3) හි විධිවිධානයන් කෙරෙහි හැඬීමකින් තොරව, අද දිනට (2019.01.08 දිනට) නියමිත න්‍යාය පත්‍රයේ අංක XII පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු විෂයය යටතේ ඇතුලත් කාර්යයන්හි අනුපිළිවෙල, පිළිවෙලින් කාර්යය අංක 02 හා 01 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කිරීමට මෙම පාර්ලිමේන්තුව එකඟ වෙයි."

XI. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය,

"බස්නාහිර පළාතේ 2018 අංක ...... දරණ බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය"

(පළමුවර කියවීම)

"බස්නාහිර පළාත තුළ සංචාරක කටයුතු වල නියැලෙන්නන්ගේ වෘත්තිය නිපුණත්වය ඉහළ නැංවීම, ඔවුන්ට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා සහාය සේවාවන් සැපයීම, සංචාරක සේවාවල ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම, සංචාරක ආකර්ෂණ ස්ථානයන් ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා පළාතේ දේශීය හා විදේශීය සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා ද, බස්නාහිර පළාතේ සංචරක මණ්ඩලය සංස්ථාපනය කිරීම සඳහා ද, 1994 අංක 03 දරණ බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා හා ඊට අනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලසීමට ද වූ ප්‍රඥප්තියකි."

# XII. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

(න්‍යාය පත්‍රයේ අංක X – සභාවේ කටයුතු යෝජනාව අනුව පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු විෂයයේ කාර්යයන්හි අනුපිළිවෙල වෙනස් වීමට ඉඩ ඇත.)

## 01. ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා :

"බස්නාහිර පළාතේ ග්‍රාමීය පාසල් වල ඉගෙනුම ලබන දරුවන්ට අද ප්‍රවාහන අපහසුතා දැඩි ලෙස බලපාන බව සියළු දෙනා දන්නා කරුණකි. ඒ හේතුවෙන් පාසල් වැන් සංස්කෘතියක් බිහි වී ඇත. ආර්ථික අපහසුතාවය සැලකිල්ලට ගෙන පාසල් සිසුන්ගේ ප්‍රවාහන අපහසුතාවය නැති කිරීම සඳහාත් නිරෝගී දරු පිරිසක් බිහි කිරීම සඳහාත්, 8 වසර පංතියෙන් ඉහළ ළමයින්ට පා පාපැදියක් ලබා දීම සුදුසුයැයි ද, ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දෙන උපමාන පාදක අරමුදල් මගින් යම් ප්‍රතිශතයකට යටත්ව ප්‍රතිපාදන වෙන් කිරීමට අවස්ථාව සලසා දීම සුදුසු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."

[යෝ/VI(1)/18/07]

## 02. ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා:

"ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම පෞද්ගලික අංශයේ ආයතන විසින් ඉතා සූක්ෂම ලෙස බස්නාහිර පළාත ඇතුලත හා දිවයින පුරාම ක්‍රියාත්මක වේ.

කණ්ඩායම් ණය සහ පෞද්ගලික ණය 40% වාර්ෂික පොලිය මත අය කර ගනියි. එය දැඩි අසාධාරණ සූරා කෑමකි. මෙම ණය ක්‍රමවේදය සම්බන්ධව මහ බැංකුවේ අධීක්ෂණය දැනට ප්‍රමාණවත් නොවන බැවින් මෙම තත්වය පිළිබඳව දැඩි අවධානය යොමු කොට මෙවැනි ණය ක්‍රම විධිමත් කිරීම සඳහා නව නීති, රෙගුලාසි කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ඉල්ලා සිටියි."

[යෝ/VI(1)/18/08]

# XIII. සභාව කල් තැබීම.

කේ. එම්. ඩී. කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.12.28 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
11 වන මහල,
බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණ නව ගොඩනැගිල්ල,
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ශ්‍රී ජයවර්ධනපුර,
බත්තරමුල්ල.